**<u>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ අධික්ෂණ කළමනාකරණ සහකාර</u>**

**<u>තාක්ෂණික සේවා සේවා ගණයේ කලාප ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට (සීමිත) බඳවා ගැනීම</u>**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ අධික්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා සේවා ගණයේ කලාප ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.** <u>අධ්‍යාපන සුදුසුකම්</u> - සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම

**2.** <u>වෘත්තීය සුදුසුකම්</u> -

(1) ජාතික ක්‍රීඩා සංගම්වලින් පවත්වන ලද පුහුණුකරු හා විනිසුරු (එතෙර හෝ මෙතෙර ) පාඨමාලා හදාරා තිබීම (අදියර 3,2,1/ A,B,C ශ්‍රේණි )
හෝ
රජය පිළිගත් ආයතනයක මාස 06 කට වැඩි ක්‍රීඩා පිළිබඳ පාඨමාලා / ඩිප්ලෝමා හදාරා තිබිම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබිම
හෝ
ක්‍රීඩා අමාත්‍යංශය මඟින් පවත්වන ලද මාස 06 ට වැඩි ක්‍රීඩා හෝ ක්‍රීඩා පරිපාලනය පිළිබඳ උසස් පාඨමාලාවක් හදාරා තිබීම
**සහ**

(11) ජාතික මට්ටමේ ක්‍රිඩක ක්‍රීඩිකාවන් බිහි කිරිමට පුහුණුව හා දායකත්වය ලබා දී තිබීම
හෝ
ක්‍රීඩා අමාත්‍යංශයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ සමස්ත කණ්ඩායම් භාර පුහුණුකරු / විනිසුරු ලෙස නියෝජනය කර තිබීම
හෝ
ක්‍රීඩා අමාත්‍යංශයේ අනුමැතිය ඇති ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමක් (ජොෂ්ඨ/කණිෂ්ඨ) නියෝජනය (ක්‍රීඩකයෙකු ලෙස)
හෝ
ශ්‍රී ලංකා වර්ණ ලාභියෙකු විම (ක්‍රීඩකයෙකු ලෙස )
හෝ
ජාතික /ජාත්‍යන්තර මට්ටමේ විනිසුරුවරයෙකු වීම

**<u>සංලක්ෂය</u>**

වෘත්තීය සුදුසුකම් යටතේ **(11)** කොටසේ සඳහන් සුදුසුකම් අතුරෙන් අවම වශයෙන්, සුදුසුකම් තුනක් (03) වත් ලබා ඇති අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දක්වා අධ්‍යාපනය ලබා තිබීම ප්‍රමාණවත් සේ සලකනු ලැබේ.

**3.** <u>පළපුරුද්ද</u> - කොළඹ මහ නගර සභාවේ ක්‍රීඩා නිලධාරී තනතුරේ ස්ථිර කර තිබීම හා අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
(මෙම වසර පහ (05) ගණනය කිරීමේදී ක්‍රීඩා නිලධාරී තනතුරේ සේවා කාලය හෝ ක්‍රීඩා නිලධාරී හා ක්‍රිඩා උපදේශක 1 ශ්‍රේණියේ සේවා කාලවල එකතුව සලකා බැලිය හැක)

**4.** <u>කායික සුදුසුකම්</u> - තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

**5.** <u>වෙනත් සුදුසුකම්</u> -

I. යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි

II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූරණ කර තිබිය යුතුය

**6.** <u>වැටුප</u> - මෙම තනතුරට හිමි වැටුප් කේත අංකය MN 3-2016 වේ. (රා.ප.ච. 03/2016 අනුව)

වැටුප් පරිමාණය - රු. 31040 -10x 445 -11x660- 10x730- 10 x 750- 57550/-

7. **<u>තනතුරෙහි ස්වභාවය</u>** - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

8. **<u>සේවා කොන්දේසි</u>** - අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

9. **<u>වයස් සීමාව</u>** - බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාව අදාළ නොවේ

10. **<u>බඳවා ගැනීමේ ක්‍රමය</u>** - 100 % සීමිත ධාරාව යටතේ බඳවා ගන්නා අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

11. **<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>** - ලකුණු ලබාදෙන පදනම හා ලකුණු

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු | තෝරාගැනිමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **<u>ජ්‍යෙෂ්ඨතාව</u>**<br>(ක්‍රීඩා නිලධාරී තනතුරේ (මූලික සුදුසුකම ) අභිබවා සේවය කර ඇති කාලය සඳහා එක් වසරකට ලකුණු 5 බැගින් වසර 05 ක් සඳහා ) | | 25 | 50 |
| **<u>කාර්ය සාධනය ඇගයීම</u>**<br>ඉතා හොඳයි - ලකුණු 04<br>හොඳයි - ලකුණු 02<br>සතුටුදායකයි - ලකුණු 01<br>(උසස්වීම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 ක කාල සීමාව ඇගයීමට ලක් කෙරේ) | | 20 | |
| **<u>ක්‍රීඩා ක්ෂේත්‍ර පිළිබඳ නව දැනුම</u>**<br>(ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලින නව්‍යකරණය, නීති රීති, ක්‍රිඩාංගන නඩත්තුව, ක්‍රීඩා තාක්ෂණය පිළිබඳ දැණුම විමසා බලනු ලැබේ) | | 30 | |
| **විශේෂ රාජකාරි කටයුතුවලදී විෂයට අදාලව දක්වන ලද දායකත්වයන්**<br>(සහතික මඟින් සනාථ කල යුතුයි. )<br>(එක් දායකත්වයක් සඳහා උපරිම ලකුණු 05 බැගින් | | 20 | |
| ජාතික සම්මේලනයක ප්‍රධාන නිලයක් දැරීම | ලකුණු 05 | | |
| ජාතික සම්මේලනයක සෙසු නිලයක් දැරීම | ලකුණු 03 | | |
| **රාජ්‍ය සේවා තරඟ ජයග්‍රහණය කිරීම** | | | |
| ශූරතාව | ලකුණු 05 | | |
| අනු ශූරතාව | ලකුණු 03 | | |
| ශ්‍රී ලංකා පිල / ජාතික මට්ටමේ නියෝජන | ලකුණු 05 | | |
| විශේෂ තරඟාවලි සංවිධානය කිරීම<br>(නගරාධිපති කුසලාන වැනි ) | ලකුණු 05 | | |
| **පෞරුෂත්වය** | | 05 | |
| **එකතුව** | | 100 | |

12. **<u>අයදුම් කිරීමේ ක්‍රමය</u>**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා විසින් පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2021.06.14** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්,බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල , නාවල පාර , රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ" **බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ කලාප ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ (සීමිත) අයදුම් පත්‍රය**" යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවූ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් ගතවූ පසුවත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන තනතුරෙහි නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(ඈ) සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියමකරන ලද නිතීරීති වලට අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

**13.** <u>**සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:**</u>

අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරදී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**14**. සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

**15**. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

**16**. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය වන / නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2021.0**5.12**

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ අධික්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා සේවා ගණයේ කලාප ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම**

**01.** 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -........................................................................................
..........................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
..........................................................................................................
(උදා: H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)-..........................................................................................

**02** 2.1 ස්ථිර ලිපිනය.........................................................................................................
..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය: .........................................................................................................
..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

**03** 3.1 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐ :

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - ☐ ස්ත්‍රී - ☐ (අදාළ කොටුව තුළ√යොදන්න)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය: ☐☐ දිනය : ☐☐

3.4 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින: ☐☐

3.5 විවාහක / අවිවාහක බව: විවාහක - ☐ අවිවාහක - ☐ (අදාළ කොටුව තුළ √ යොදන්න)

3.5 දුරකථන අංකය ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

3.6 දුරකථන අංකය ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

**04** **අධ්‍යාපන සුදුසුකම්**

1) අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

| පළමුවර :- | | | දෙවනවර :- | | |
|---|---|---|---|---|---|
| විභාගයේ වර්ෂය හා මාසය :- | | | විභාගයේ වර්ෂය හා මාසය :- | | |
| | විෂය | ශ්‍රේණිය | | විෂය | ශ්‍රේණිය |
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |
| 9 | | | 9 | | |
| 10 | | | 10 | | |

2) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 02 හි සංලක්ෂය යටතේ සුදුසුකම් ලබන්නේ නම් අ.පො.ස. (සා.පෙ) දක්වා වන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර:-
..........................................................................................................
..........................................................................................................
(ඉහත අංක 4 හි අදාල කොටස සම්පූර්ණ කරන්න)

**05 වෘත්තීය සුදුසුකම්**

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 02 හි (1) හෝ (11) යටතේ ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර
( අදාල කොටස පමණක් සම්පූර්ණ කරන්න)

අංක 02 (1) හි සඳහන් සුදුසුකම්

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

අංක 02 (11) හි සඳහන් සුදුසුකම්

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

06 සේවා විස්තරය

5.1 ක්‍රීඩා නිලධාරී තනතුරට පත්වූ දිනය :- ..............................................................................

5.2 එම තනතුරේ සේවා කාලය :- ..........................................................................................

5.3 එම තනතුර ස්ථිර කල දිනය :- .......................................................................................

5.4 එම තනතුර ස්ථිර කිරීමේ ලිපියේ යොමු අංකය හා දිනය :- ..................................................
.............................................................................................................................

5.5 ක්‍රීඩා නිලධාරී තනතුරේ අයදුම්පත් කැඳවන **2021.06.14** දිනට පූර්වාසන්න වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද යන බව :- ..............................................

5.6 ක්‍රීඩා උපදේශක 1 ශ්‍රේණියේ සේවා කාලය :-.........................................................................

5.7 වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර ..............................................................
.............................................................................................................................

5.5 ඔබ දැනට සේවය කරන ආයතනය :- .................................................................................

5.6 ඔබගේ පෞද්ගලික ලිපි ගොණුව පවත්වාගෙන යන කාර්යාලය හා එහි ලිපිනය
…..........................................................................................................................
.............................................................................................................................

5.7 ආයතන ප්‍රධානියාගේ නිල නාමය ................................................................................

**07 <u>අයදුම්කරුගේ සහතිකය :</u>**

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි,

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකුබව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි,

(ඇ) තව ද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් පනවනු ලබන කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුර හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි,

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය ........................................ ........................................................

අයදුම්කරුගේ අත්සන

**08** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................................................

මයා/මිය/මෙනවිය මෙම කාර්යාලයේ සේවය කරන අතර ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

දිනය ..........................................                ........................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
.........................................................................................................
තනතුර හා ලිපිනය :
.....................................................................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

සටහන :- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරිමට බලය ලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කල යුතුය.

**09.** **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................... මයා/මිය/මෙනවිය ...........................................................................කාර්යාලයේ/ආයතනයේ ............................ දින සිට මේ දක්වා ........................................................... (තනතුර) වශයෙන් සේවය කරන බව දන්වන අතර පහත සඳහන් තොරතුරු ඔහුගේ /ඇයගේ පෞද්ගලික ලිපිගොණුව අනුව සහතික කරමි.

1. ඉහත නම සඳහන් නිලධාරියා / නිලධාරිනිය දැනට දරණ තනතුර, ස්ථිර කිරමේ ලිපියක් නිකුත් කර ඇති බවද,
2. කලාප ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් සපුරා ඇති බවද,
3. අයදුම්පත් කැඳවන **2021.06.14** දින වන විට, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවද,
4. කලාප ක්‍රීඩා නිලධාරී තනතුරේ අයදුම්පත් කැඳවන **2021.06.14** දිනට ක්‍රීඩා නිලධාරී තනතුරේ පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවද,
5. වැටුප් රහිත නිවාඩු ලබා ඇති /නොමැති බවද,
6. මෙම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු /ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කරන බවද / නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය ..........................................                ...............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම : .....................................................................................

තනතුර : .........................................................................................................................

ලිපිනය : .........................................................................................................................